## Abstract 14

# ගණිකා වෘත්තිය පිළිබඳ බෞද්ධ ආකල්පය

**පී. ජී. ඩී. ප්‍රියදර්ශනී,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) ප්‍රථම වසර - බෞද්ධ සංස්කෘතිය),
*dinushapriyadarshani94@gmail.com*

ගණිකා වෘත්තිය පුරාතනයේ සිට පැවති ජීවනෝපායයක් වේ. ලිඛිත සාක්ෂ්‍ය අනුව එවකට එම වෘත්තිය කෙරෙහි කාන්තාවන් යොමුවීම සිදු වී ඇත්තේ දිළිඳුකම නිසා ම නොවේ. එහෙත් වර්තමානය වන විට ගණිකා වෘත්තිය සාධු සමාජ සම්මත ජීවනෝපායයක් නො වන අතර ගණිකාවන් සැලකෙනුයේ සමාජ දූෂකයන් වශයෙනි. පවුල් සංස්ථා බිඳවැටීම්, සමාජ රෝග පැතිරයාම, ආර්ථික බිඳවැටීම් හා සමාජ අපචාර වර්ධනය වීම ආදී බොහෝ අංශ කෙරෙහි මෙය බලපා තිබේ. සමාජ සම්මතය සහ නීතිරීති ආදිය පිළිබඳ එකිනෙක රටවල භාවිතය වෙනස් වන නමුත් ගණිකා වෘත්තිය හේතුවෙන් සිදුවන සමාජ ශුභසිද්ධියට වඩා අයහපත ප්‍රබල වන බව හඳුනාගෙන ඇත. එහෙත් ධනවාදී ආර්ථික ජීවන රටාව තුළ ගණිකා වෘත්තිය කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් පවත්වා ගෙන යාමට බොහෝ රටවලට සිදුව තිබේ. **තායිලන්තය** වැනි බෞද්ධ රටවල ලිංගිකත්වය පිළිබඳ භාවිතය විමසා බැලීම මෙයට කදිම නිදසුනක් වේ. මෙම නිසා ප්‍රබල සමාජ සංසිද්ධියක් වන ගණිකා වෘත්තිය පිළිබඳ විවෘත මනසකින් බැලිය යුතුව පවතී. **අම්බපාලි, අඩ්ඪකාසි** වැනි ප්‍රසිද්ධ ගණිකාවන් බුදුරදුන් වෙතින් අවඥාවට ලක් නො වීම ද සැලකිල්ලට ගනිමින් බෞද්ධ ඉගැන්වීම් පාදක කරගනිමින් ගණිකා වෘත්තිය පිළිබඳ විමර්ශනයක් කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. බුදුදහම අබියස ගණිකාව අසරණ තත්ත්වයකට පත්වේ ද, සමාජ ආර්ථික හේතු අබියස ඔවුන් පත් වී ඇති තත්ත්වය සම්බන්ධයෙන් බුදුදහම දක්වන ආකල්පය කුමක් ද, ගණිකාව සම්බන්ධයෙන් ධර්මයෙන් නිර්දේශ කරන ප්‍රතිපදාව කුමක් ද යනාදී කරුණු රාශියක් සාකච්ඡාවට භාජනය විය යුතු අතර ඒ පිළිබඳව පැමිණෙන විනිශ්චය සමාජ භූමිකාවට වැදගත් අනාවරණයක් වනු ඇත.

**ප්‍රමුඛ පද :** අපචාර, ගණිකා වෘත්තිය, දිළිඳුකම, ධනවාදය, බුදුදහම